
# 6 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ සමාජය

මෙම ඒකකය හැදෑරීමෙන් ඔබට,

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නිසා සමාජයීය වශයෙන් සිදු වී ඇති වෙනස්කම්

පිළිබඳව අවබෝධයක් ලැබෙනු ඇත.

## 6.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නිසා සමාජීය වශයෙන් සිදු වී ඇති වෙනස්කම් කිහිපයක්



## පාසල - e-ඉගෙනුම




- පින්තූර සහ ප්‍රායෝගික පරීක්ෂණ සහිත වීඩියෝ දර්ශන මගින් පැහැදිලි කිරීම
- අන්තර්ජාලය මගින් තොරතුරු සොයා ගැනීම
- වෙනත් පාසල් සමග සංවාද සහ පණිවිඩ හුවමාරුව
- ඕනෑ ම තැනක සිට ඕනෑ ම වේලාවක අධ්‍යාපනය ලැබිය හැකි වීම

## රෝහල - e-සෞඛ්‍ය



- රෝග හඳුනා ගැනීමේ පරිගණක පාදක කරගත් නවීන උපකරණ භාවිතය
- රෝගියාගේ විස්තර රැස්කර තබා ගැනීම සහ අවශ්‍ය වූ විට ලබා ගැනීමේ හැකියාව

## රාජ්‍ය සේවය - e-රාජ්‍ය




- බිල්පත් ගෙවීමේ සේවා
- ආකෘති පත්‍ර, ණය පහසුකම් විස්තර
- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය
- අන්තර්ජාලය ඔස්සේ රජයේ විශ්වවිද්‍යාල සඳහා අයදුම් කිරීම
- චක්‍ර ලේඛන, නීති පද්ධති
- ගැසට් පත්‍ර ලබා ගත හැකිවීම
- ශ්‍රී ලංකා සිතියම

## e-වාණිජ




- අන්තර්ජාලය හරහා භාණ්ඩ හුවමාරුව
- මාර්ගගත සාප්පු සවාරිය (online shopping) සහ මිල දී ගැනීම

ක්‍රියාකාරකම සඳහා වැඩපොතේ 6.1 බලන්න.






## අංකිත බෙදීම



පරිගණකය සහ අන්තර්ජාලය වැනි නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාංග සහ සම්පත් භාවිතය සඳහා පහසුකම් තිබීම/නොතිබීම නිසා සමාජයක් තුළ ඇතිවී තිබෙන බෙදීම **අංකිත බෙදීම** ලෙසින් දැක්වේ.


ක්‍රියාකාරකම සඳහා වැඩපොතේ 6.2 බලන්න.




රූපය 6.1 – විද්‍යුත් අපද්‍රව්‍ය (e waste)

## විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ඇති විය හැකි විෂ වර්ග සහ එමගින් මිනිසාට සිදු විය හැකි හානි




6.2 – විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ඇතිවන හානි.

මූලාශ්‍රය : ewise.co.nz/the-impact-of-ewate/


## 3R ක්‍රමවේදය හරහා විද්‍යුත් අපද්‍රව්‍ය අවම කරමු

- අනවශ්‍ය භාණ්ඩ එක්රැස් කිරීම හා මිල දී ගැනීම අවම කරමු - Reduce
- හැකි සෑම විට ම අලුත්වැඩියා කර නැවත භාවිත කරමු - Reuse
- අනවශ්‍ය සියල්ල ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා සුදුසු ආයතනවලට භාර දෙමු - Recycle




ක්‍රියාකාරකම සඳහා වැඩපොතේ 6.3, 6.4 සහ 6.5 බලන්න.

## 6.2 පරිගණක ආශ්‍රිත රැකියා අවස්ථා



| | |
|---|---|
| මෘදුකාංග තත්ත්ව සහතික ඉංජිනේරු<br>Software Quality Assurance Engineer<br><br>මෘදුකාංග කේත පරීක්ෂා කිරීම සහ මෘදුකාංගයේ තත්ත්වය සහතික කිරීම | දත්ත සමුදාය පරිපාලක<br>Database Administrator<br><br>දත්ත සමුදාය සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, වින්‍යාසගත කිරීම සහ දෝෂ ගවේෂණය කිරීම |
| මෘදුකාංග ඉංජිනේරු<br>Software Engineer<br><br>මෘදුකාංග නිර්මාණය කිරීම | වෙබ් අඩවි යෙදීම් සංවර්ධනකරු<br>Web Application Developer<br><br>වෙබ් අඩවි නිර්මාණය, සංවර්ධනය හා යාවත්කාලීන කිරීම |
| මෘදුකාංග නිර්මාණ ශිල්පි<br>Software Architect<br><br>ඉහළ මට්ටමේ මෘදුකාංග නිර්මාණය කිරීම, සුදුසු මෘදුකාංග නිර්මාණ ශිල්පය තෝරා ගැනීම හෝ නිර්මාණය | චිත්‍රක නිර්මාණකරු<br>Graphic Designer<br><br>වෙබ් පිටු, වෙළෙඳ දැන්වීම්, සඟරා, බැනර් ආදිය පරිගණක ආශ්‍රයෙන් නිර්මාණය කිරීම |
| වැඩසටහන් ක්‍රමලේඛක<br>Programmer<br><br>නොයෙකුත් පරිගණක භාෂා භාවිත කරමින් වැඩසටහන් සම්පාදනය කිරීම | පද්ධති විශ්ලේෂක<br>System Analyst<br><br>ආයතනවල අවශ්‍යතා විශ්ලේෂණය කරමින් පරිගණක පද්ධති නිර්මාණය කිරීම, ක්‍රමලේඛකයන් විසින් පද්ධති ගොඩනගන ආකාරය විග්‍රහය කිරීම |
| ජාල පරිපාලක<br>Network Administrator<br><br>පරිගණක ජාල ස්ථාපනය කිරීම, නඩත්තුව, අලුත්වැඩියාව වැනි ජාල සම්බන්ධ ක්‍රියාකාරකම් කිරීම | තාක්ෂණික මග පෙන්වන්නා<br>IT Consultant<br><br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව උපදෙස් ආයතනවලට ලබාදීම |

ක්‍රියාකාරකම සඳහා වැඩපොතේ 6.6 සහ 6.7 බලන්න.

## සාරාංශය

- අධ්‍යාපනය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, වාණිජ්‍යය, රාජ්‍ය සේවය ආදී ක්ෂේත්‍රවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ඒවායේ කාර්යක්ෂමතාවට හේතු වී ඇත.
- පරිගණක සහ අන්තර්ජාලය භාවිතයට ඇති හෝ නැති බව අනුව මිනිසුන් අතර බෙදීමක් ඇති වී තිබේ. මෙය අංකිත බෙදීම නම් වේ.
- විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර නොකිරීම මිනිසා ඇතුළු සියලු ම සත්ත්වයින්ගේ ජීවිතවලට තර්ජනයකි.
- විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සඳහා 3R (**R**educe, **R**euse, **R**ecycle) සංකල්පය යොදා ගත හැකි ය.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත රැකියා රාශියක් ඇත.